# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.02.11 පැය 0535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/242/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධයකට අවශ්‍ය කර සිටි සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියක් අත් අඩංගුවට - විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2026.02.07 වන දින කළුතර දකුණ පොලිස් වසමේ නාගොඩ ප්‍රදේශයේදී පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය සහ කළුතර දිසා අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

විමර්ශන නිලධාරින්ට ලද තොරතුරකට අනුව ඉහත අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු 2026.02.10 වන දින දහවල් බලංගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන කළුතර දිසා අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන නාගොඩ, කළුතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධව සිදු කළ වැඩිදුර විමර්ශනයේදී ඉහත අපරාධයට අමතරව පහත අපරාධ සිදු කර ඇති බවට අනාවරණය වී ඇත.

- 2025.12.31 දින නාගොඩ රෝහල තුලදී බන්ධනාගාර රැඳවියෙකුට වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කිරීම.
- 2026.01.09 දින දෙහිවල පොලිස් වසමේදී හෝටලයක හිමිකරුවෙකු වෙඩි තබා ඝාතනය කිරීම.

2026.02.07 වන දින කළුතර දකුණ පොලිස් වසමේ නාගොඩ ප්‍රදේශයේදී සිදුකළ වෙඩි තැබීමට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු සහ සැකකාරියක් ද කළුතර සහ බලංගොඩ ප්‍රදේශවලදී විමර්ශන නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 23 හා 24 වයස්වල පසුවන කළුතර ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 23 ක් වන බොලොස්සගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කළුතර දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2026.02.10 දින කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත පොළොන්නරුව පොලිස් වසමේ සුදුනෙළුම්ගල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 205 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොළොන්නරුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන අළුත්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොළොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගහහේන පොලිස් ස්ථානය.

2026.02.10 දින සවස මොරගහහේන පොලිස් වසමේ මිල්ලෑව ප්‍රදේශයේදී මොරගහහේන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 67.5 ( බෝතල් 90 ) ක් සහ නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 1085 (බැරල් 06) ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස 33 ක් වන මිල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

## 04. නීති විරෝධී මත්පැන් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - හලාවත කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය ඒකකය.

2026.02.10 දින දහවල් හලාවත පොලිස් වසමේ තාලඩියවැල්ල ප්‍රදේශයේදී හලාවත කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර නිති විරෝධී මත්පැන් ලීටර් 60ක් (බෝතල් 80) සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන හලාවත පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකාරිය වයස අවුරුදු 63 ක් වන තාලඩියවැල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

හලාවත පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. ගංජා හේන් දෙකක් වැටලීම - ඇතිමලේ පොලිස් ස්ථානය.

2026.02.10 දින ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ඇතිමලේ පොලිස් වසමේ කැබිලිත්ත රක්ෂිතයේ කලාප අංක 05 හි අක්කර 01යි පර්චස් 03 ක පමණ භූමි ප්‍රමාණයක වගා කරන ලද ගංජා පැළ 14360 ක් (දාහතර දහස් තුන්සිය හැටයි) සහිත ගංජා හේන් දෙකක් වටලා ඇත.

නඩු භාණ්ඩ ලෙස සාම්පල් ලබා ගැනීමෙන් පසු ගංජා පැළ ගිනිතබා විනාශ කර ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඇතිමලේ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **දියේ ගිලී විදේශීය ජාතිකයෙකු මියයාම - අළුත්ගම පොලිස් වසම.**

2026.02.10 වන දින සවස් අළුත්ගම මුහුදු තීරයේ දිය නෑමට ගිය විදේශිය ජාතිකයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට අළුත්ගම පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක් වූ ජර්මන් ජාතිකයෙකි.**

මරණකරු සහ බිරිඳ මෙරට සංචාරයක් සඳහා පැමිණ සිටින අතරතුර මුහුදේ දියනෑමට ගොස් සිටියදී මෙලෙස අනතුරට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.අළුත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**07.** **ලොරි රථයක ත්‍රීරෝද රථයක් ගැටී පුද්ගලයෙකු ජීවිතක්ෂයට - මහව පොලිස් වසම.**

2026.02.10 දින උදෑසන මහව පොලිස් වසමේ පාදෙනිය අනුරාධපුර මාර්ගයේ දළදාගම ප්‍රදේශයේදී පාදෙනිය දෙස සිට අනුරාධපුර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියැදුරු තුවාල ලබා මහව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 73 ක් වූ අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට අදාල ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මහව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

**08.** **යතුරුපැදියක් විදුලි රැහැන් කණුවක ගැටී යතුරුපැදිකරු ජීවිතක්ෂයට - මොරටුව පොලිස් වසම.**

2026.02.10 දින රාත්‍රී මොරටුව මෝදර මැද මාර්ගයේ ශාන්ත පීතර පටුමග ප්‍රදේශයේදී මොරටුව දෙසට අධික වේගයෙන් ධාවනය වූ යතුරුපැදියක් වෙනත් වාහනයකට ඉස්සර කිරීමට යාමේදී පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු පානදුර මූලික රෝහලට ඇතුළත් කර ඇති අතර රෝහල් ගතකරන විට පැදිකරු මියගොස් සිට ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වූ කොරලවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යතුරුපැදිකරුගේ අධික වේගය හා අපරීක්ෂාකාරි ධාවනය හේතුවෙන් මෙම අනතුර සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**